Alcohol and Drug
Information Centre

ADIC

No.40/18, Park Road, Colombo 05, Sri Lanka.
Tel: +94 11 2584416,+94 11 2592515, Fax: +94 112508484
Email: info@adicsrilanka.org
Web site: http//www.adicsrilanka.org

**මාධ්‍ය නිවේදනය 03 - 2021/12/15**

## කංසා නොහොත් ගංජා නීතිගත කිරීමේ වාසිය කාටද ?

පසුගිය වසර පුරා ලෝකයේ ගංජා නීතිගත කිරීම පිළිබඳ සංවාදයක් හටගත් නමුත් එය පිටුපස ඇති බලවේගය දුම්කොළ කර්මාන්තය යන්න හඳුනා ගැනීමට හැකි වී ඇත. බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගම කැනඩාවේ ගංජා නිෂ්පාදන සමාගමක කොටස් මිලදී ගැනීම සඳහා පවුම් මිලියන 126 ක් ආයෝජනය කර ඇත. මීට අමතරව ලෝකයේ ප්‍රධාන පෙලේ දුම්කොළ සමාගමක් වන අල්ට්‍රියා සමාගම ඇමරිකානු ඩොලර් බිලියන 1.8 ක් ගංජා ව්‍යාපාරයක් ලෙස ආරම්භ කිරීමට ආයෝජනය කර ඇත.


දුම්කොළ සමාගම්වල රහස් වාර්තාවන්ට අනුව ගංජා යනු අභිම්වෙමින් යන සිගරට් වෙළඳපොලට හොඳ විකල්පයක් බව ඔවුන් තීරණය කර ඇත. ඒ අනුව දුම්කොළ සමාගම පවසන්නේ ඔවුන් සතුව ගංජා වැවීමට විශාල ඉඩම් ඇති බවත්, ඒවා එතීමට හා පැකට් කිරීමට යන්ත්‍ර සූත්‍ර ඇති බවත් හා ලොව පුරා බෙදා හැරීමේ හැකියාව ද ඔවුනට ඇති බවත්ය.

දුම්කොළ සමාගමට අවශ්‍ය පරිදි ගංජා ව්‍යාපාරය පවත්වාගැනීමට නොහැකි වී ඇත්තේ ලෝකයේ බොහොමයක් රටවල ගංජා තහනම් කර ඇති බැවිනි. එබැවින් ජාත්‍යන්තතරව ගංජා ව්‍යාපාරය ව්‍යාප්තිය සඳහා ගංජා නීතිගත කිරීමේ කූඨ උත්සහයක නිරත වේ. එහි ප්‍රධාන උපක්‍රමයක් ලෙස හඳුනාගත හැක්කේ අප වැනි දියුණුවෙමින් පවතින රටවලට ගංජා වගාකර එයින් විදේශීය විනිමය ලබා ගත හැකි බව මවා පාමින් ගංජා නීතිගත කිරීමට උත්සහ දැරීමයි.

**ගංජා වගාකර අපනයන කිරීම දියුණු වෙමින් පවතින අප වැනි රටවලට ලාබදායි ද?**

ලෝකයේ ගංජා ව්‍යාපාරයට අවතීර්ණ වූ බොහෝ සමාගම් විශාල ලෙස පාඩු ලබා ඇත. ලෝකයේ විශාලතම ගංජා වෙළෙඳුන් පසුගිය වසරවල ඩොලර් බිලියන ගනණක අලාභ වාර්තා කර තිබේ. මෙය ඔවුන්ගේ ව්‍යාපාරවල වටිනාකම පසුගිය වසරවල ඇමරිකානු ඩොලර් බිලියන 10කට වඩා පහත වැටී ඇත. ලෝක ගංජා (හෙම්ප්) තෙල් මිල 2019 සිට 75% වඩා පහත වැටී ඇත. ගංජා නිෂ්පාදන සඳහා ඉල්ලුම අඩු වුවත් දැඩි අධිසැපයුමක් ඇති බැවින් ලෝකයේ ගංජා තෙල් නිෂ්පාදනවල මිල විශාල ලෙස පහත වැටී තිබේ.

එමෙන්ම අද ලංකාවේ දුම්කොළ වගාව බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගමේ අණසක යටතට පත් කරගත් ආකාරයටම ගංජා වගාව රට තුළ ආරම්භ කළ ද එහි අයිතිය සහ ලාභය ගංජා සමාගම් යටතට පත්වීම අනිවාර්යයෙන්ම සිදු වනු ඇත. (මේ වන විට ලෝකයේ ගංජා ගොවිපොලවල් සීඝ්‍ර ලෙස දුම්කොළ සමාගම් විසින් මිලදී ගනිමින් පවතී.)





Report: Hemp Prices Plunging Due to Oversupply, Limited Demand



FINANCIAL POST


Cannabis Investing / Cannabis Business / Cannabis

**Hemp prices plunge as CBD demand falls short in a 'grossly oversupplied' market**

*Hemp biomass prices reached a high of over US$40 a pound in July — it's now trading under US$10 a pound*

Bloomberg News
Kristine Owram

Jan 27, 2020 • January 27, 2020 • 3 minute read • Join the conversation



**OVER-SATURATION**

McMahon said growers are making less money per pound than previous years because the suppliers' market is over-saturated.

"The steep drop in price is due largely to a dramatic increase in the volume of cannabis production coming from other areas of the state," McMahon said.

Not only are more cultivators starting cannabis business ventures for the first time, but more established cultivators are becoming licensed.

https://www.theunion.com/news/the-economics-of-pot-price-of-cannabis-flower-drops-50-from-last-year/

**ආරක්ෂක අංශවල මැදිහත්වීම යටතේ ගංජා වගා කර අපනයනය කිරීම කෙතරම් ප්‍රායෝගික ද ?**

ආරක්ෂක අංශවෙල මැදිහත්වීම යටතේ මහජනතාවට බලපෑමකින් තොරව ගංජා වගා කර අපනයනය කළ හැකි බව ගංජා ප්‍රවර්ධනය කරන්නන්ගේ තර්කයකි. මෙහි ප්‍රායෝගික තත්වය නම් දැනටමත් ආරක්ෂාවන් යටතේ ගංජා වගා කළ සහ නිෂ්පාදනය කළ රටවල මේ වන විට නීති විරෝධී ගංජා ව්‍යාපාරය දැඩි ලෙස ව්‍යාප්ත වී ඇති බවයි. එමෙන්ම ලෝක ඉතිහාසයේ සිගරට් ප්‍රවර්ධනය සඳහා ආරක්ෂක අංශවලට නොමිලේ හෝ සහන මිලකට සිගරට් ලබා දීම බහුල ලෙස සිදු වූ බවට සාක්ෂි ඇත. නීත්‍යානුකූල නිෂ්පාදන සමගම නීති විරෝධි ව්‍යාපාර හිස එසවීම සාමාන්‍ය ස්වාභාවයයි. ශ්‍රී ලංකාව තුළ ද මද්‍යසාර හා දුම්කොළ යන දෙක ම සම්බන්ධයෙන් මෙසේ නීති විරෝධි කටයුතු සිදු වීම අප විසින් අත්දකිමින් සිටි. එබැවින් ගංජා ආරක්ෂිතව වගා කළ හැකි බවට සහ අපනයනය කළ හැකි බවට මතු කරන තර්කයන් හුදු සෛද්ධාන්තික ඒවා මිස ප්‍රායෝගික යථාර්තයන් නොවේ.

**ගංජා ඖෂධයක් ලෙස භාවිත කිරීමේ ඇත්ත තත්වය**

දැනට බටහිර වෛද්‍ය විද්‍යාවේ කංසා යොදාගෙන නිපදවා ඇත්තේ ඖෂධ දෙකක් පමණක් වන අතර ඒවායින් එකක් බ්‍රිතාන්‍යයේ NICE ආයතනයේ 2019 වසරේදී ඔවුන්ගේ අනුමත කිරීමේ ලැයිස්තුවෙන් ඉවත් කරන ලදී.

ගංජා ඖෂධයක් ලෙස දේශීය වෛද්‍ය ක්‍රමය තුළ ගංජා භාවිත කරන නමුත් දේශීය වෛද්‍ය ක්‍රමය තුළ ගංජා දුමක් ලෙස ආශ්‍රහණය කිරීම කිසිදු ආකාරයකින් අනුමත කිරීමක් සිදු නොකරයි. තවද දේශීය වෛද්‍ය ක්‍රමය තුළ ගංජා දුමක් ලෙස ආශ්‍රහණය කිරීම රෝග රාශියකට හේතුවන බව පැහැදිලිව දක්වා ඇති අතර ඖෂධයක් ලෙස යොදාගන්නේ දීර්ඝ විෂ හරණ ක්‍රියාවලියකින් පසුවයි. උදාහරණ ලෙස එළඟි තෙලෙහි බැදීමෙන් සහ තැඹිලි වතුරෙන් තැම්බීම ආදී ක්‍රම මගින් එහි විෂ නැසීමට යොදා ගනි.

**ගංජා භාවිතයේ සැබෑ තත්වය**

ගංජා භාවිතය නිසා සිදුවන මානසික විකෘති තත්ත්වය නිසා සියදිවි හානිකරගැනීම් සහ ස්වයං හානිකර ගැනීම් බහුලව සිදුවේ. තවද පර්යේෂණ මගින් කංසා සෘණාත්මක ලෙස මොළයට බලපාන බව පෙන්වාදී තිබේ. සියලුම විද්‍යාත්මක පදනම්වලට අනුව ඇබ්බැහි වීමටත් සම්බන්ධකමක් ඇති කරයි. යොවුන් පරපුර සඳහා ගංජා මගින් නැවත නිවැරදි කිරීමට නොහැකි බලපෑමක් අති කරයි. එමෙන්ම වයස අවුරුදු 18 පෙර ගංජා භාවිත කිරීමට පටන් ගත් තරුණයන් ඒ සඳහා ඇබ්බැහි වීමේ ශීඝ්‍රතාවය වැඩිකරයි. ගංජා භාවිතා කිරීමෙන් අනතුරුව රිය පැදවීම රිය අනතුරු බහුලව සිදුවීමට බලපාන බව පර්යේෂණ මගින් අනාවරණය කරගෙන තිබේ.

**දැනටමත් නීති ලිහිල් කර ඇති රටවල වර්තමාන තත්වය**

රටවල් 193කට වැඩි සංඛ්‍යාවක් වන එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් අතරින් රටවල් පහක් (උරුගුවේ, මෙක්සිකෝ, ජෝර්ජියා, දකුණු අප්‍රිකාව සහ කැනඩාව) පමණක් සහ තවත් රටවල් කිහිපයක ප්‍රාන්ත හෝ දිස්ත්‍රික් කිහිපයක් පමණක් මත්ද්‍රව්‍යක් ලෙස ගංජා භාවිතය සම්බන්ධයෙන් නීති ලිහිල් කර ඇත. මෙම තීරණ දේශපාලන තීරණ මිසක විද්‍යාත්මක තීරණ නොවේ.

මෙලෙස ගංජා නීතිගත කළ රටවල වර්තමානයේ ඇති වී ඇති සමාජ බලපෑම අතිවිශාලය. විශේෂයෙන්ම තරුණ ප්‍රජාව අතර ගංජා භාවිතය විශාල ලෙස වර්ධනය වී ඇති බවත් පාසල් සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය අතහැර දැමීම ගංජා භාවිත නිසා ඇති වී තත්වයක් බව සමීක්ෂණවලින් පැහැදිලි වී ඇත. එමෙන්ම නව යෞවනයන් පිරිස් අතර සියදිවි හානි කරගැනීම් වර්ධනය වීමට ගංජා බලපා ඇති බව අනාවරණය වී ඇත. ගංජා නීතිගත කළ රටවල සිදු කළ අධ්‍යනවලින් පැහැදිලි වන්නේ එම රටවල අපරාධ වර්ධනය වීමටත් ගංජා භාවිතය බලපා ඇති බවයි. තවද රටේ ශ්‍රම බලකාය දුර්වල වීමට ද ගංජා බලපා ඇති බව මෙම අධ්‍යයනවලින් තහවුරු වී ඇත.

මෙවන් පසුබිමක සාවද්‍ය තොරතුරු ජනගත කරමින්, පුජා පක්ෂය, දේශපාලඥයින්, වෘත්තිකයන්, කලාකරුවන් මාධ්‍යවේදීන් යොදා ගනිමින් ගංජා නීති ශ්‍රී ලංකාව තුළ ලිහිල් කිරීමට සිදු කරන කූඨ උත්සහය පරාජය කළ යුතු වේ. බහුජාතික දුම්කොළ සමාගම්, ඒවායේ දේශිය නියෝජිතයින්, කරුණු හරිහැටි විශ්ලේෂණය නොකල දේශපාලඥයින් සහ සමාජ මාධ්‍ය හරහා ගංජා ආර්ථික බෝගයක් ලෙස හුවා දක්වමින් අප රට උගුලක හසු කිරීමට ගන්නා මෙම ප්‍රයත්නය පරාජය කළ යුතු වේ.

මේ ක්‍රියාත්මක වන්නේ ඔබේ දරුවාගේ පාසල ඉදිරිපිට ඇති වෙළඳසැල තුළ පවා දුම්වැටි අලෙවිකරනවා සේම ගංජා අලෙවි කිරීමේ උත්සාහයේ මුලික පියවරයි.

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
නො. 40/18,
උද්‍යාන පාර,
කොළඹ 05.